ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UVP/BD/E/PS/UP/2021/23

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 අගෝස්තු 10 දින.

06 OCT 2021

ජාතික විගණන උප කාර්යාලය
මහා නගර සභාව
බදුල්ල.

සභාපති,
ඌවපරණගම ප්‍රාදේශිය සභාව.

ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වන වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව

2018 අංක19 දරන ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

02. මේ සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 39 වගන්තියේ සඳහන් විධි විධාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර,මෙම වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම,ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මාස 03 ක් ඇතුළත මාවෙත වාර්තා කළ යුතුය.

03. මෙම වාර්තාවේ පෙන්වාදී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව,ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු ඇත්නම් ඒ බවද මාවෙත වාර්තා කළ යුතුය.

එස්.එම්.විජේරත්න
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත :- ගරු ආණ්ඩුකාරතුමා - ඌව පළාත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

Scanned with CamScanner

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UVP/BD/E/PS/UP /2021/23 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 අගෝස්තු 10 දින.

ජාතික විගණන උප කාර්යාලය
මහා නගර සභාව
බදුල්ල.

සභාපති,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව.

ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වන වගන්තිය ප්‍රකාර සභාව වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක කළමනාකරණ විගණකාධිපති වාර්තාව

ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ක්‍රියාත්මක කරන ලද විගණනයේ ප්‍රතිඵල විස්තරාත්මකව මෙම වාර්තාව මඟින් නිකුත් කරනු ලැබේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

Scanned with CamScanner

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජනා කරනු ලබන පියවර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ පාලක මණ්ඩලය විසින් මා වෙත දැන්වීම අවශ්‍ය වේ.

1.3 විගණන විෂය පථය

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

Scanned with CamScanner

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

1.4.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක්ද	පාලන අවදානම් අනාවරණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ රු.498,962 ක් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දක්වා තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ගන්නා බව සඳහන් කර ඇත.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

Scanned with CamScanner

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු රු.6,663,318 ක් වුවද, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,133,780 ක් ලෙසට රු.5,529,538 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ගන්නා බව සඳහන් කර ඇත.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.
(ඇ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය(LDSP) යටතේ ලැබී තිබුණු රු.2,823,380 ක් සභාවේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ගන්නා බව සඳහන් කර ඇත..	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.4.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	නව නිරීක්ෂණයක් ද පවත්නා / නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉඩම් හා ගොඩනැගිලි	30,935,413	පැවරුම් නියෝග,හිමිකම් සහතික සහ අයිතිය තහවුරු කිරීමේ ලියවිලි	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉදිරියේදී පැවරුම් නියෝග/ හිමිකම් සහතික ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කර ඇත.	මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

Scanned with CamScanner

1.5 **අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය			
	රීති 114	2010 වසරේ අවස්ථා 06 කදී ගෙවා තිබුණු අත්තිකාරම් රු.440,958 ක් එම කාර්ය නිම වූ වහාම පියවා ගත යුතු වුවද, එසේ පියවාගෙන නොතිබුණි.	පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපූරණය නොකිරීම නිසා 2019/02/14 දින සභාවේ තීරණයක් අනුව වැඩ අවසන් කර්මාන්ත වලට සභා අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත.	අත්තිකාරම් අයකර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය			
	14.10 වගන්තිය	2017 වර්ෂයේදී ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය රු.59,890 ක් අය කරගෙන නොතිබුණි.	ආයතන සංග්‍රහය අනුව කටයුතු කරන බව සඳහන් කර ඇත.	හිඟ සේවක ණය ශේෂ අයකරගත යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	මුදල් රෙගුලාසි 571	තැන්පත් කර වසර 02 කට වැඩි කාලයක් ගත වී තිබුණු ගැල්වනයිස් යකඩ බට මිලදී ගැනීමට අදාල තැන්පතු රු.74,178 ක් නියාදනය කර නොතිබුණි.	එම මුදලින් ගැල්වනයිස් බට මිලදී ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත.	මිලදී ගැනීම් සිදුකර ගිණුම් වලට ඇතුළත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,815,542 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,356,170 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2020				2019			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
I	වරිපනම්	3,019,540	3,215,058	2,375,093	839,965	2,719,540	2,882,453	2,363,420	519,033
Ii	හා බදු කුලී	972,700	983,736	772,330	211,406	875,000	1,008,535	898,054	110,481
iii	බලපත්‍ර ගාස්තු	1,175,000	1,302,665	1,302,665	-	1,100,000	1,100,000	1,176,525	(76,525)
Iv	වෙනත් ආදායම්	1,700,000	2,356,100	2,157,976	198,124	1,253,000	2,733,896	2,391,310	342,586
	එකතුව	6,867,240	7,857,559	6,608,064	1,249,495	5,947,540	7,724,884	6,829,309	895,575

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි කුලී රු.455,200 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	මෙම වර්ෂය තුළ අය කර ගන්නා බව සඳහන් කර ඇත.	හිඟහිටි කඩ කුලී අය කර ගත යුතුය.

Scanned with CamScanner

56

(ආ) වසර 02 කට අධික කාලයක සිට පැවත එන ප්‍රාග්ධන ආධාර රු.2,161,645 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	වර්ෂය තුළ අය කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත.	ප්‍රාග්ධන ආධාර අය කරගෙන ගිණුම් වලට ඇතුළත් කළ යුතුය.
(ඇ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.15,600,000 ක් හා මුද්දර ගාස්තු රු.1,133,780 ක් අය කරගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	වර්ෂය තුළ අය කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත.	හිඟ ආදායම් අය කරගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක්ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වසර 02 කට අධික කාලයක සිට පැවත එන කර්මාන්ත ණය හිමියෝ රු .10,032,269 ක් හා වියදම් ණය හිමියෝ රු.421,912 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	හිඟ මුදල් මෙම වර්ෂයේදී අයකර ගන්නා බව සඳහන් කර ඇත.	ණයහිමි ශේෂ නිරවුල් කළ යුතුය.

Scanned with CamScanner

5̇0

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් ධාවනය කළ හැකි තත්ත්වයේ පවතින ට්‍රම්ප් ට්‍රැක්ටරයක් ආදායම් උපයාගැනීමේ විකල්ප මාර්ග වලට යොමු නොකර වසර 02 ක කාලයක් නිෂ්කාර්යයව සභා භූමියේ ගාල් කර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සභාවේ ඉල්ලීමකින් තොරව ලැබී ඇති බව හා ආදායම් උපයාගැනීම සඳහා යෙදවීමට උත්සාහ කරන බව සඳහන් කර ඇත..	සභාව සතු වත්කම් ඵලදායි අයුරින් ආදායම් ඉපයීමේ කාර්යය සඳහා යෙදවිය යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඌන භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබුණු රු.68,457ක පුස්තකාල පොත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2) අනුව කටයුතු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	මු.රෙ.757(2) අනුව කටයුතු කරන බව සඳහන් කර ඇත.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

Scanned with CamScanner

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක්ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලයේ පැවති එක් පුරප්පාඩුවක් පුරවා නොතිබුණු අතර,කනතුරු 03 කට අදාල 07 දෙනෙකුගෙන් සමන්විත අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සෞඛ්‍ය කම්කරු පුරප්පාඩුව පුරවා ඇති බවත්, අනෙක් පුරප්පාඩු සඳහා දන්වා ඇති බවත්,අතිරික්තතා අනුමත කරගන්නා බවත් සඳහන් කර ඇත.	පවතින පුරප්පාඩු පුරවාගත යුතු අතර, අතිරික්ත සේවකයින් අනුමත කරගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉදිරියේදී පිළියෙල කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත.	නියමිත කාලයේදී පිළියෙල කර අනුමත කර ගතයුතුය.

Scanned with CamScanner

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද පවත්නා / නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව, ඇස්තමේන්තු කල වියදම්,වර්ෂයේ සත්‍ය වියදම් සමඟ සැසඳීමේදී වියදම් විෂයයන් 05 ක සියයට 34 සිට සියයට 86 දක්වා විචලනයක් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වී ඇති බව සඳහන් කර ඇත.	නිවැරදි අයවැය ලේඛනයක් පිළියෙල කර එහි දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුය.

(එස්.එම්.විජේරත්න)

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත :- ගරු ආණ්ඩුකාරතුමා - ඌව පළාත

Scanned with CamScanner